**චීනයේ එක්සිම් බැංකුව (හුනන් ශාඛාව) අරමුදල් සපයන මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2022**

---

චීනයේ එක්සිම් බැංකුව (හුනන් ශාඛාව) අරමුදල් සපයන මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කි.මී. 64.31 ක් දිග මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මේ යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග කි.මී. 62.06 ක් පළාත් මාර්ග කි.මී. 2.25 ක් සහ පාලම් 13 ක් ප්‍රතිසංස්කරණය කිරීමට නියමිතය. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කොන්ත්‍රාත් එක සහ දෙක යන කොටස් 02 යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,674.90 කට සමාන එ. ජ. ඩො. මිලියන 100 ක් වන අතර ඉන් රු.මිලියන 10,774.74 කට සමාන එ. ජ. ඩො. මිලියන 85 ක් චීන අපනයන ආනයන බැංකුව විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 1,900.16 කට සමාන එ.ජ.ඩො. 15 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2018 නොවැම්බර් 29 දින ආරම්භ කරන ලද අතර 2020 නොවැම්බර් 28 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2022 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය.**

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර 2022 දෙසැම්බර් 31 දිනට චීනයේ එක්සිම් බැංකුව (හුනන් ශාඛාව) අරමුදල් සපයන මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු/විගණන නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| (i) | ප්‍රමාණ පත්‍ර හරහා මිලදී ගත් වත්කම් ව්‍යාපෘතිය විසින් ප්‍රාග්ධනිත කර නොතිබුණි. ඊට අමතරව, ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘතියේ භාවිතය සඳහා මිලදී ගත් වාහනය සහ රසායනාගාර උපකරණ වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද, ඉහත අගය 2022 දෙසැම්බර් 31 දිනට කාරක ප්‍රාග්ධනයට ඇතුළත් කර තිබුණි. එබැවින් කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 91.51 | ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් වන තෙක් සම්පූර්ණ කළ ව්‍යාපෘතියෙන් කොටසක් ප්‍රාග්ධනිත කළ නොහැක. | ව්‍යාපෘති වත්කම් හඳුනාගෙන වාර්තා කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ii) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි අංක 39 වගන්තියට අනුව, විදේශ මුදල් විනිමය අනුපාතිකයේ වෙනස්වීම් නිසා ඇතිවන ලාභ හෝ පාඩු මුදල් ප්‍රවාහයක් නොවන අතර මුදල් හා මුදල් සමාන දෑ ආරම්භක සහ අවසන් ශේෂ සංසන්දනය කිරීමේ දී අදාළ බලපෑම වාර්තා කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් වලින් උපයා ඇති රු. මිලියන 344 ක මුදලක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස සටහන් කර තිබුණු බැවින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 344 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 විදේශාධාර ව්‍යාපෘති සඳහා සඳහන් කළ ආකාරයට යොදාගත නොහැක. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (iii) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 07 හි 24 සහ 25 වගන්තිවලට අනුව, වත්කමක් ලෙස හඳුනාගැනීමට සුදුසුකම් ලබන දේපළ, පිරියත සහ උපකරණ එහි පිරිවැය හෝ ධාරණ වටිනාකමට අගය කළයුතුය. කෙසේ වෙතත්, මාර්ග සංවර්ධන අධිකාරියෙන් ව්‍යාපෘතියට ලැබුණු වත්කම් 156 ක් ඉහත ප්‍රමිතියට අනුකූලව අගය කර නොතිබුණි. | - | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවරා ඇති වත්කම් ව්‍යාපෘතිය මඟින් ප්‍රාග්ධනිත කළ නොහැක. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (iv) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය 5 හි 43(අ වගන්තිය අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් එ එක් වත්කම් සහ වගකීම් එම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙ අවසන් දිනට වූ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දින ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ විනිමය ගැළපී රු.මිලියන 11,926 ක් වුවත්, එයින් රු.මිලිය 3,787 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. | 7,537 | ශ්‍රී.ලං.රා.අං.ගි.ප්‍ර. අංක 5 හි 31 වගන්තිය අනුව, විදේශ විනිමය වෙනස හඳුනා ගෙන ශුද්ධ විදේශ ණය වත්කම් / හිමිකම් යටතේ සහ කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |

**2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| අංකය | නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2019 මාර්තු 15 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 උප වගන්තිය. | චක්‍රලේඛයට අනුව සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | COVID 19 වසංගත තත්ත්වය, ඉන්ධන හිඟය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කළ යුතු බව. |
| (ii) | පිළිවෙලින් 2009 අප්‍රේල් 16 දින සහ 2009 ජූනි 17 දින නිකුත් කරන ලද අංක. 09/2009 සහ 09/2009/I දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ. | ව්‍යාපෘති අධ්‍යක්ෂ, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ ගණකාධිකාරී විසින් චක්‍රලේඛයට අනුව ඔවුන්ගේ පැමිණීම සහ පිටවීම තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. | ජාතික ප්‍රමුඛතාවයක් සහිත ව්‍යාපෘතියකට තාවකාලිකව පත් කිරීම හේතුවෙන් මෙම නිලධාරීන්ට එක්සිම් හුනාන් ව්‍යාපෘතියේ කාර්යාලයේම අඛණ්ඩව රාජකාරි කරගෙන යාමට නොහැකි විය. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළයුතු බව. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (i) | අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට යටත්ව, මෙම ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 20,500 ක් දක්වා සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, අදාළ අනුමැතිය 2023 මාර්තු 03 දක්වා ලබාගෙන නොතිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ සමඟ සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව පිළිබඳ සවිස්තර වාර්තාවක් 2023 අප්‍රේල් 3 දින අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කටයුතු කළ යුතු බව. |
| (ii) | 2022 ජනවාරි 31 දින මාර්ග 05 ක් සහ පාලමක් දෝෂ 24 ක් සහිතව මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ද්‍රව්‍ය හිඟය සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් සමහර වැඩ කොන්ත්‍රාත්කරුට නිම කිරීමට නොහැකි විය. | අඩුපාඩු නිවැරදි කිරීමට කඩිනම් පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2018 ජුනි 7 දිනැතිව විදේශ ණය ප්‍රදානකරු සමඟ ඇති කර ගෙන තිබුණු ගිවිසුම අනුව, ව්‍යාපෘති කාලය 2021 සැප්තැම්බර් 28 දින අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත්, ව්‍යාපෘතිය 2022 සැප්තැම්බර් 28 දක්වා දීර්ඝ කර තිබුණි. තවද, දීර්ඝ කළ කාල සීමාව තුළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට නොහැකි වීම හේතුවෙන්, ව්‍යාපෘති කාලය 2023 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කරන ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2022 ඔක්තෝබර් 21 දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණ ද, 2023 මාර්තු 27 දින වන විටත් අදාළ අනුමැතිය ලැබී නොතිබුණි. | ණය ගිවිසුම 2023/12/31 දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. ණය නියෝජිතායතනය සමඟ සම්බන්ධීකරණය කර කාල දිගුව අනුමත කර ගැනීම සඳහා අදාළ අනුමැතිය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු බව. |
| (iv) | ව්‍යාපෘතියේ මූලික කාර්යසාධන දර්ශක හඳුනා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එබැවින්, ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | ඉදිකිරීම් අවසන් කරන ලද මාර්ග දිග හෝ සම්පූර්ණ කරන ලද පාලම් සංඛ්‍යාව මූලික කාර්යසාධන දර්ශක ලෙස සැලකේ. | "SMART" මූලික කාර්යසාධන දර්ශක ස්ථාපිත කළ යුතු බව. |